# HISTORICAL STUDY OF BOOK PUBLISHING IN THE KOTTE ERA

Anusha Sajeewanie Rubasinghe[1]


## Abstract

The basic elements of writing and paper printing led the world to book publishing. Although these three things have become the basic elements of the publishing industry today, it is clear when examining the facts about broadcasting in the publishing industry that it took a long time for each of those elements to become the present state. Book publishing is the result of all the work, from writing a manuscript to publishing it. Although in the early days, it was operated without a purely commercial objective, now it is accepted that it is operated purely with a commercial objective. The main purpose of this research is to analyse the historical situation of book publication in the Kotte era. Data was collected with the help of secondary sources and analysed using the historical analysis method. The conclusions obtained after analysing the data can be presented as follows. The importance of the publishing industry in the Kotte era is the emergence of a group of scholars who had an incredible ability to write literature in the Kotte era. Among them, the academic service of Vidagama Maithri Thero can be highlighted. Also, the fact that the chief ruler of the country, the king, was also aware and understanding of literature and engaged in book publishing led to the development of book publishing during this era. Through research findings, it can be testified that there were daily copyists apart from the authors. They served as clerks, and their work was invisible and tremendous. This research confirmed the basic process inherent in publishing, copywriting and distributing in this era.


**Keywords:** Book publication, History of Kotte Period, Literature

[1] Senior Assistant Librarian, The Library, University of Kelaniya Sri Lanka.

Email: sajeewanie@kln.ac.lk https://orcid.org/0000-0002-6291-2836

Accepted the revised version: 01 December 2023. This work is licensed under C BY-SA 4.0. To view a copy of this license, visit http://creativecommons.org/licenses/by-sa/4.0/

# කෝට්ටේ යුගයේ ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

**සාරසංක්ෂේපය**

ලිවීම, කඩදාසි මුද්‍රණය යන මූලික අංග පොත් ප්‍රකාශනය සඳහා ලොවට මග පෑදුවේය. අද පවත්නා ප්‍රකාශන කර්මාන්තයේ මූලික අංග බවට මෙම කරුණු තුන පත්ව තිබුණ ද ප්‍රකාශන කර්මාන්තයේ විකාශය පිළිබඳ ව කරුණු පරීක්ෂා කිරිමේ දී පැහැදිලි වන්නේ ඒ එක්, එක් අංග අද පවත්නා තත්ත්වයට පත් වීමට බොහෝ කලක් ගත වූ බවයි ග්‍රන්ථ ප්‍රකාශනය යනු අත්පිටපතක් ලිවීමේ කාර්යයේ සිට එය මුද්‍රණාද්වාරයෙන් එළි දැක්වීමේ කාර්යය දක්වා වන සියලුම කාර්යයන්ගේ ප්‍රතිඵලය වේ. අතීතයේ දී එය හුදු වාණිජමය පරමාර්ථයෙන් තොරව ක්‍රියාත්මක වුවද වර්තමානයේදී දී එය හුදෙක් ම වාණිජමය පරමාර්ථයෙන් ක්‍රියාත්මක වන බව පෙනී යයි. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ කෝට්ටේ යුගයේ ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳ ඓතිහාසික තත්ත්වය විශ්ලේෂණය කිරීමයි. මෙහිදී ද්විතීයික මූලාශ්‍ර ඇසුරු කරගනිමින් ඒ පිළිබඳ ව දත්ත රැස් කරන ලද අතර ඓතිහාසික විශ්ලේෂණ විධි ක්‍රමය යටතේ දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව ලබාගත් නිගමනයන් මෙලෙස ඉදිරිපත් කළ හැකිය. කෝට්ටේ යුගයේ ප්‍රකාශන කර්මාන්තය සම්බන්ධයෙන් ඉතා වැදගත් වන්නේ සාහිත්‍යකරණය පිළිබඳ අසහාය හැකියාවකින් යුක්ත වූ විද්වත් පිරිසක් කෝට්ටේ යුගයේ බිහිවීමයි. ඒ අතුරින් ද වීදාගම මෛත්‍රී හිමියන්ගේ ශාස්ත්‍රීය සේවාව සුවිශේෂ කොට දැක්විය හැකිය. එමෙන්ම රටේ ප්‍රධාන පාලකයා රජු සාහිත්‍යය පිළිබඳ දැනුවත් වීම හා අවබෝධයකින් යුක්ත වීම මෙන්ම, ග්‍රන්ථකරණයෙහි නියැලීම කෝට්ටේ යුගයේ ග්‍රන්ථ ප්‍රකාශනය වර්ධනය විමට හේතු වී ඇති බව කරුණු විශ්ලේෂණයේදී අනාවරණය විය. එමෙන්ම කෝට්ටේ යුගය තුළ දිනපතා ග්‍රන්ථ පිටපත් කරන්නන් සිටි බවත් ඔවුන් ලිපිකරුවන් මිස ලේඛකයන් නොවන බව තොරතුරු ගවේශණයේ දී අනාවරණය විය. ග්‍රන්ථ රචනය පිටපත් කරණය සහ බෙදා හැරීම යන ප්‍රකාශනයකට ආවේණික වූ මූලික ක්‍රියාවලියෙන් කෝට්ටේ යුගයේ දී දක්නට ඇති බව මේ පර්යේෂණයේ දී තහවුරු විය.

**ප්‍රමුඛ පද :** ග්‍රන්ථ ප්‍රකාශනය, කෝටටේ යුගයේ ඉතිහාසය, සාහිත්‍යකරණය

***හැඳින්වීම***

අනාදිමත් කාලයක සිට මිනිසා විසින් තම අදහස් හා මතවාද අන් අයට දැනගැනීමට සැලැස්වීම සඳහා විවිධ ක්‍රම අනුගමනය කරන ලදී. එසේ විකාශය වූ සන්නිවේදන ක්‍රමවල එක් ප්‍රතිඵලයක් ලෙස ග්‍රන්ථ බිහිවීම පෙන්වි දිය හැකිය. එක් අතකින් එය අදහස් හා මතවාද ලේඛනගත කිරීම සඳහා උපස්ථම්භක වූ අතර අනෙක් අතින් ඒවා තවත් පුද්ගලයෙක් වෙත සන්නිවේදනය කිරීම සඳහා යොදා ගනු ලැබූ ප්‍රබල මාධ්‍යයක් බවට ද පත් විය. ග්‍රන්ථ ප්‍රකාශනය විවිධ ආකාරයෙන් විකාශය වූ ආකාරය විවිධ ශිෂ්ටාචාර සහ සංස්කෘතීන් ආශ්‍රයෙන් පැහැදිලි කරගත හැකිය. ලිවීම, කඩදාසි සහ මුද්‍රණය නූතන ග්‍රන්ථ ප්‍රකාශනයේ පදනම ලෙස සැලකිය හැකි වුව ද කඩදාසි සහ මුද්‍රණය නොතිබූ යුගවල දී පවා ග්‍රන්ථ ප්‍රකාශනය පැවති බව එම ශිෂ්ටාචාරවලින් සහ සංස්කෘතීන්ගෙන් ලැබෙන සාක්ෂිවලින් අනාවරණය වේ. එසේ වුවද කඩදාසි සහ මුද්‍රණය බිහිවීමෙන් පසු ග්‍රන්ථ ප්‍රකාශනය රටවල් අතර ජාතීන් අතර සහ මහද්වීප අතර පැවති සීමා බාධක ඉවත් කරමින් අතිවිශාල කර්මාන්තයක් බවට පත්ව තිබේ.

ශ්‍රී ලංකාව සිය ඉතිහාසය පුරාම ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳ විවිධ අවධි පසුකරමින් වර්තමානය වන විට එය සැලකිය යුතු මට්ටමකින් ජාත්‍යන්තර තත්ත්වයේ කර්මාන්තයක් බවට පත්කරගෙන තිබේ. එය රටේ ජන සංඛ්‍යාවෙන් අති විශාල ප්‍රමාණයකට බලපාන්නාවූ සහ සම්බන්ධ වන්නා වූ කර්මාන්තයක් බවට පරිවර්තනය වී තිබේ.

**අධ්‍යයන ගැටලුව**

ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශනය මුද්‍රණ කර්මාන්තය හේතුවෙන් මේ වන විට අතිවිශාල කර්මාන්තයක් බවට පත්ව ඇති නමුදු ඓතිහාසික ග්‍රන්ථ සහ සාහිත්‍ය ග්‍රන්ථවල මුල් කාල යුගවල දී ශ්‍රී ලංකාවේ කිසියම් ආකාරයක ග්‍රන්ථ ප්‍රකාශනයක් පැවතියේ යැයි අනුමාන කළ හැකි ආකාරයේ සාධක දක්නට ලැබේ. එබැවින් ශ්‍රී ලංකාවේ ලේඛන ඉතිහාසය තුළ කෝට්ටේ යුගයේ ග්‍රන්ථ ප්‍රකාශන කර්මාන්තය පැවතියේ ද යන්න විග්‍රහ කිරීම මෙම අධ්‍යයනයේ ගැටලුව වේ.

**අධ්‍යයනයේ අරමුණ**

අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ කෝට්ටේ යුගයේ ප්‍රකාශන කර්මාන්තයක් පැවතියේ ද යන්නත් එසේ පැවතියේ නම් එය විකාශය වූ ආකාරය විමර්ශනය කිරීමත් ය.

**සාහිත්‍යය විමර්ශනය**

ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳ පර්යේෂණ සිදුවී ඇත්තේ ඉතා අල්ප ප්‍රමාණයකිනි. ඒ ආකාරයට සීමිත සාහිත්‍යයක් පැවතීම කෙරෙහි විවිධ කරුණු බලපා ඇති බව පෙනේ ග Altbach & Hoshinoල 1995 ග්‍රන්ථ ප්‍රකාශනය සැලකිය යුතු ප්‍රමාණයක සාහිත්‍යයක් නිෂ්පාදනය කළ විෂයයක් නොවේ යැයි සදහන් කර ඇත. ඔහු ඒ පුදුමය දනවන්නක් බව සඳහන් කර තිබේ. වත්මන් විද්‍යුත් මාධ්‍ය ක්‍රමය තුළ පවා පොත් සහ සඟරා ජාත්‍යන්තර විද්‍යාත්මක සන්නිවේදන ක්‍රමයන්හි මූලික මාධ්‍ය බවට පත්ව තිබෙන අතර සහශ්‍රවර්ෂය තුළ ලිඛිත සන්නිවේදනයේ ප්‍රධාන මාධ්‍ය බවට පත්ව ඇත්තේ ද පොත් ය. එසේ වුව ද ඒ පිළිබඳ සාහිත්‍යයක් ගොඩ නැගී නොතිබීම මවිතයට කරුණක් බව ඔහුගේ අදහස වේ. ඔහුට අනුව පොත් ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රමාණවත් තරමින් සාහිත්‍යයක් බිහි නොවීම කෙරෙහි කරුණු කිහිපයක් බලපා තිබේ.  පොත් ඉතා දිගු කලක සිට බිහි වෙමින් පැවතුණි. පුරාතන සුමේරියන් සහ චීන ශිෂ්ටාචාරවල සිට ප්‍රධාන ලිඛිත සන්නිවේදනයේ මාධ්‍යය වූයේ පොත් ය. මුල දී චීනයේ සහ පසු යුරෝපයේ, අතින් ගෙන යා හැකි ග්‍රන්ථ බිහිවීමට පෙර පවා එම රටවල ග්‍රන්ථ ප්‍රකාශයට පත්වී තිබුණි. ඒ අතර ග්‍රන්ථ පැරණි තාක්ෂණය පෙන්නුම් කරන කැඩපතක් වූ අතර ඒ පිළිබඳ ව යොමු වූයේ අඩු අවධානයකි. පුවත්පත් සහ රූපවාහිනිය ආදී මාධ්‍යන් පිළිබඳ ව සලකන විට පොත්වල සමාජීය බලපෑම අඩු මට්ටමක පවතින බව ප්‍රකාශ කළ හැකිය. එබැවින් පොත් පිළිබඳ ව අධ්‍යනය කිරීමට වඩා ඉහත කී මාධ්‍ය පිළිබද අධ්‍යනය කිරීමට බොහෝ දෙනෙක් පෙළඹී සිටින බව පෙනේ. ග්‍රන්ථ ප්‍රකාශන සාහිත්‍යයට අදාළ ව පවතින පොත්පත් හෝ සඟරා හෝ ඒ පිළිබඳ අධ්‍යයන සහ පර්යේෂණ ආදීයෙහි සීමා සහිත බවට හොඳම නිදසුන වන්නේ පුස්තකාල හා විඥාපන විද්‍යා සංක්ෂේපය (LISA- Library and Information Science Abstract) වැනි ප්‍රකාශනවල ද ප්‍රකාශන කර්මාන්තයේ ඉතිහාසය අදාළ අධ්‍යයන,  පර්යේෂණ පිළිබඳ ව තොරතුරු සීමා සහිත වීමයි.

කෙසේ වුවද ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳ දැනට ලබාගත හැකි සීමිත අධ්‍යයන ප්‍රමාණය පවා සිදුකර ඇත්තේ රටවල් කිහිපයකට පමණක් අදාළ වන අයුරිනි. ඇමරිකා එක්සත් ජනපදය,  මහා බ්‍රිතාන්‍යය, ජර්මනිය, ජපානය සහ ප්‍රංශය වැනි රටවල ග්‍රන්ථ ප්‍රකාශයට අදාළ ව යම් යම් අධ්‍යනයන් සිදු කර තිබේ. කෙසේ වුව ද ඒවා ද වැඩි ප්‍රමාණයක් ඉංග්‍රීසි භාෂාවෙන් රචනා වී තිබේ. ඉංග්‍රීසි භාවිත කරන රටවල් ග්‍රන්ථ ප්‍රකාශනයේ සමාරම්භකයෝ නොවූහ. ඔවුන් ග්‍රන්ථ ප්‍රකාශනයට එළැඹියේ චීනය වැනි රටවලට පසුවය. ග්‍රන්ථ ප්‍රකාශයට අදාළ සාහිත්‍ය විමර්ශනයේ දී පැහැදිලි වන මූලිකම කරුණ වන්නේ ඊට අදාළ සාහිත්‍යය සීමා සහිත බවත් දැනට සිදු කෙරී ඇති අධ්‍යයන බොහොමයක් රටවල් කිහිපයකට පමණක් සීමා වී ඇති බවත්ය. Briggs (1974) දී  ප්‍රකාශයට පත් කළ අධ්‍යයනය ග්‍රන්ථ ප්‍රකාශන පිළිබඳ සිදුකළ මුල්කාලීන අධ්‍යයනයක් ලෙස හඳුන්වාදිය හැකිය. Essays in the History of Publishing නමැති එම අධ්‍යයනය මේ පිළිබඳ ව ඇති අනෙකුත් අධ්‍යයනයන්ට වඩා වෙනස් වන්නේ ඒ ප්‍රකාශන කර්මාන්තය පිළිබඳ ව ගැඹුරු නොවූවද තරමක ශාස්ත්‍රිය අධ්‍යයනයක් ඒ තුළින් ගෙන එන බැවිනි. ප්‍රකාශන කර්මාන්තය ඉතිහාසය, වර්තමාන ස්වරූපය සහ ඒ සම්බන්ධ විවිධ අංශ මෙමගින් විමර්ශනයට ලක් කර තිබේ.

ටැබෙල්ගේ (Tebble, 1972) ඇමරිකා එක්සත් ජනපදයේ ග්‍රන්ථ ප්‍රකාශන කර්මාන්තය පිළිබඳ අධ්‍යයනය ඇමරිකා එක්සත් ජනපදයේ පොත් ප්‍රකාශනය පිළිබඳ ප්‍රමාණාත්මක අගයක් ලෙස සඳහන් කළ හැකිය. ඔහුගේ අධ්‍යයනය වැදගත් වන්නේ එය ඇමරිකා එක්සත් ජනපදයේ පොත් ප්‍රකාශනය පිළිබඳ ව දැනට බිහිවී ඇති සවිස්තරාත්මක සහ විද්‍යාත්මක ප්‍රකාශනය වීම හේතුවෙනි.

සංවර්ධනය වෙමින් පවත්නා රටවල ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳ විශාල ප්‍රමාණයක නොවූවත් ඇතැම් අධ්‍යයන සිදු වී ඇති බව පෙන්වා දිය හැකිය. Hallewell (1982) බ්‍රසීලයේ ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳව සැලකිය යුතු මට්ටමක අධ්‍යයනයක් ඉදිරිපත් කර තිබේ. Books in Brazil (A history of the Publishing Trade නමැති එම අධ්‍යයනය බ්‍රසීලය තුළ එම අවදියේ පැවති ග්‍රන්ථ ප්‍රකාශන කර්මාන්තයේ  ස්වරූපය පිළිබඳ ව කරුණු ඉදිරිපත් කිරීම සඳහා යොදා ගෙන තිබේ.

Tayler (1995)  ඉන්දියාවේ ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳ ව අධ්‍යයනයක් සිදු කර තිබේ. ඔහු ජපානය, හොංකොං, තායිවානය, දකුණු කොරියාව, තායිලන්තය,  මැලේසියාව,  ඉන්දුනීසියාව වැනි රටවල පවත්නා ග්‍රන්ථ ප්‍රකාශන කටයුතු පිළිබඳ ව සමස්තයක් ලෙස ඇගයීමක් කිරීමට උත්සාහ කර තිබේ. ආසියානු රටවල් අතර ග්‍රන්ථ ප්‍රකාශන කර්මාන්තයේ වෙනස්කම් ඇති වීම කෙරෙහි බලපා ඇති හේතු

කිහිපයක් ඔහු විසින් හඳුනාගෙන තිබේ. දේශපාලන නිදහස, මුද්‍රණ දැනුම, ජාත්‍යන්තර තාක්ෂණය කෙරෙහි ඇති දොරටු, ආර්ථික සංවර්ධනය, අධ්‍යාපනය කතෘ අයිතිය, දූෂණයෙන් තොර වීම ආදිය මෙම රටවල ග්‍රන්ථ ප්‍රකාශනය කෙරෙහි බලපානු ලබන බව ඔහු විසින් පෙන්වා දී ඇත. කෙසේ වුවද ඔහුගේ අධ්‍යනයේ දී දකුණු ආසියාව පිළිබඳ අවධානය යොමු වී ඇත්තේ ඉතා අඩු මට්ටමකිනි. දකුණු ආසියාවේ රටවල් සමහරක් පිළිබඳව ඔහු නාමිකව සඳහන් කර ඇති නමුත් ඔහුගේ අධ්‍යනය මුළුමනින්ම අදාළ වන්නේ අග්නිදිග ආසියාතික රටවල් පිළිබඳවය. වඩාත් වැදගත් කරුණ වන්නේ ඔහුගේ අධ්‍යයනයේදී ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳව කිසිදු කරුණක් සඳහන්ව නොතිබීම යි.

ආසියානු රටවල් අතරෙන් ද ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳව ඉතා අඩු සාහිත්‍යයක් ඇත්තේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් යැයි ප්‍රකාශ කළ හැකිය. ලෝක ප්‍රකාශන කර්මාන්තය පිළිබඳව Altabch සහ Hoshino (1995) අධ්‍යයනය තුළ ආසියාවට අදාළ කොටසේ දී ශ්‍රී ලංකාවට අදාළ සංඛ්‍යා ලේඛන අනෙක් රටවල් සමග ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර තිබේ. ඒ හැරෙන්නට ඔහුගේ අධ්‍යයනයේ දී ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳ ව වෙනත් කිසිවක් සඳහන් නොවේ. ඔහු සඳහන් කරන ආකාරයට ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳ ව සාහිත්‍යය සීමා සහිත වීමට හේතු වී ඇත්තේ පුවත්පත් සහ විද්‍යුත් මාධ්‍ය වැනි සන්නිවේදන ක්‍රම පිළිබඳ ව විද්වතුන්ගේ වැඩි අවධානයක් යොමු වීමයි.

ඉහත සඳහන් කළ පරිදි ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශයට පත්වී ඇති ග්‍රන්ථ සංඛ්‍යාව සීමා සහිත වුව ද ඊට අදාළ වෙනත් විෂයයන් පිළිබඳ ව යම්යම් අධ්‍යයන සිදු කර ඇති බව පෙන්වා දිය හැකිය. මෙම අධ්‍යයන බොහෝමයක් මුද්‍රණ කර්මාන්තයට සම්බන්ධ ව බව සඳහන් කළ හැකිය. පෙරේරාගේ (1961) අධ්‍යයනය ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පයේ ඉතිහාසය පිළිබඳ අධ්‍යයනයකට සීමා වී තිබේ. මේ ආකාරයටම ශ්‍රී ලංකාවේ මුද්‍රණ කර්මාන්තයට අදාළව අධ්‍යයනයන් රැසක් වෙයි. හේමපාල (1987), හපුආරච්චි (2003) වැනි අයගේ අධ්‍යයන මූලික වශයෙන්ම ශ්‍රී ලංකාවේ මුද්‍රණ කර්මාන්තය ආරම්භ වූ ආකාරය සහ විකාශය වූ ආකාරය අධ්‍යයනය කිරීම සඳහා යොදා ගෙන තිබේ.

ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශනය මාතෘකාව ලෙස යොදාගෙන ඇති අධ්‍යයන කිහිපයක් ද අපට හමු විය. කෙසේ වුව ද ඒවා විමර්ශනය කිරීමේ දී පැහැදිලි වූයේ ග්‍රන්ථ ප්‍රකාශන යන නම යොදා ගෙන තිබුණ ද ඒවායේ මූලික අරමුණ වී ඇත්තේ ශ්‍රී ලංකාවේ මුද්‍රණ කර්මාන්තය පිළිබඳව කරුණු අධ්‍යනය කිරීමට බවය. කෙසේ වුව ද ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳ ව තොරතුරු මූලාශ්‍රයන් වශයෙන් වැදගත් වන අධ්‍යයන කිහිපයක් ද සිදු වී ඇති බව, ඒ පිළිබඳ සාහිත්‍ය විමර්ශනයක දී වටහා ගත හැකිවේ. ඒ අතුරින් ඉතා වැදගත් වන අධ්‍යයන දෙකක් වන්නේ කළුකොඳයාවේ පඤ්ඤාසේකර හිමියන් විසින් ප්‍රකාශකරන ලද ශ්‍රී ලංකාවේ පුවත්පත් සඟරා ඉතිහාසය සහ පුංචි බණ්ඩාර සන්නස්ගල මහතා විසින් සංස්කරණය කරන ලද සිංහල සාහිත්‍ය වංශය යන ග්‍රන්ථ දෙකයි.

කළුකොඳයාවේ පඤ්ඤාසේකර හිමියන්ගේ ශ්‍රී ලංකාවේ පුවත්පත් සඟරා ඉතිහාසය කෘතියේ මුල් වෙළුම 1965 දී ප්‍රකාශයට පත් විය. ඉන්පසු 1971 දක්වා කාල පරිච්ඡේදය තුළ එම ප්‍රකාශනයේ වෙළුම් නමයක් මුද්‍රණයෙන් නිකුත් විය. ඉතා දුර්ලභ ආකාරයේ පුවත් පත් සඟරා එකතු කර ඒවා අධ්‍යයනය කිරීමෙන් පසු ප්‍රකාශයට පත් කර ඇති මෙම ග්‍රන්ථ මාලාව ශ්‍රී ලංකාවේ යටත් විජිත යුගයේ සිට මෑත අවධිය දක්වා පළවූ පුවත්පත් සඟරා බොහොමයක් පිළිබඳ අධ්‍යයනය කර තිබේ.

පුංචි බණ්ඩාර සන්නස්ගල මහතාගේ සංස්කරණයෙන් ප්‍රකාශිත සිංහල සාහිත්‍ය වංශය නම් කෘතිය ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශනය ආරම්භ වූ අවස්ථාවේ සිට මේ දක්වා වූ කාල පරිච්ඡේදය තුළ බිහි වූ සිංහල සාහිත්‍ය කෘති පිළිබඳ තොරතුරු ඇතුළත් අධ්‍යයනයකි. එම කෘතිය මඟින් ශ්‍රී ලංකාවේ රාජධානි යුගවල ඓතිහාසික තොරතුරු සහ සාහිත්‍යයන් ගේ පසුබිම ආදිය විස්තර කර ඇති අතර ශ්‍රී ලංකාවේ සියලුම සාහිත්‍ය ග්‍රන්ථවල විස්තර සහිත නාමාවලියක් ද ඉදිරිපත් කර තිබේ. එය ශ්‍රී ලංකාවේ සාහිත්‍ය ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳව ඉතා වැදගත් අධ්‍යයනයක් ලෙස සැලකිය හැකිය. එසේ වුවද රට තුළ බිහි වූ සාහිත්‍ය නොවන ප්‍රකාශන පිළිබඳ අවධානයක් යොමු කර නැති බැවින් ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳ අධ්‍යයනය කිරීමේදී සමහර අංශ පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට ඉන් ලැබෙන පිටුවහල අඩු බව ප්‍රකාශ කළ යුතුය. එවැනි පසුබිමක් තුළ කෝට්ටේ යුගයේ ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳ අධ්‍යයනය යෙදීම කාලානුරූප අවශ්‍යතාවක් බවට පත්ව තිබේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා මූලික වශයෙන්ම උපයෝගි කර ගනු ලබන්නේ ඓතිහාසික මූලාශ්‍ර වේ. ඒ ඇසුරින් ද මහාවංසය ඇතුළු වංශ කතා ප්‍රධාන වශයෙන්ම භාවිත කළ අතර අට්ඨකථා ද පැරණි සාහිත්‍ය ග්‍රන්ථ ද උපයෝගී කරගන්නා ලදී. මෙම මූලාශ්‍රය ආශ්‍රයෙන් ලබා ගන්නා ලබාගන්නා තොරතුරු මගින් ශ්‍රී ලංකාවේ කෝට්ටේ යුගයේ විධිමත් ග්‍රන්ථ ප්‍රකාශනයක් පැවතියේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා ඓතිහාසික විශ්ලේෂණ ක්‍රමය භාවිතාකරනු ලැබීය.

**කෝට්ටේ යුගයේ ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳ විශ්ලේෂණය**

ශ්‍රී ලංකා ඉතිහාසය අධ්‍යයනයේදී විදේශ ආධිපත්‍යයට පෙර, රට අන්තිමට එක්සත් ව පැවති යුගය ලෙස සැලකිය හැකි වන්නේ කෝට්ටේ යුගයයි. VI වන පරාක්‍රමබාහු රජ දවස (ක්‍රි. ව. 1412-1467) ශ්‍රී ලංකාව එතෙක් පැවති බිඳී ගිය රාජ්‍ය එක්සේසත් කර මුළු දිවයින ම එක් රාජ්‍යයක් බවට පත්කරනු ලැබීය. එම රජුගේ අවුරුදු 55ක රාජ්‍ය කාලය කාලය ඇතුළත රට එක්සේසත් ව පැවතුණ අතර දීර්ඝ කාලයක් තිස්සේ පැවති සාමකාමී වාතාවරණය ද දේශපාලන ස්ථාවර බව ද, ආර්ථික සමෘද්ධිය ද, දියුණු සාහිත්‍යයක් ඇති කිරීම සඳහා මඟ පෑදුවේය. ඒ ආකාරයට ක්‍රි.ව. 1412 සිට ක්‍රි.ව. 1580 දක්වා අවුරුදු 166 කාල පරිච්ඡේදය ප්‍රකාශන කර්මාන්තය සම්බන්ධයෙන් ඉතා වැදගත් කාල පරිච්ඡේදයක් ලෙස හැඳින්විය හැකිය.

VI වන පරාක්‍රමබාහු රජු, (ක්‍රි. ව. 1412-1467) රට එක්සත් කිරීමට තරම් ශක්තියකින් යුතු පුද්ගලයකු වූ අතර අනෙක් අතින් සාහිත්‍ය පිළිබඳ දැනුමක් සහ අවබෝධයකින් යුක්ත වූ පුද්ගලයෙකු ද විය. මෙම තත්ත්වය කෝට්ටේ යුගයේ ශ්‍රී ලංකාවේ ප්‍රකාශන කර්මාන්තය සම්බන්ධයෙන් ඉතා වැදගත් සහ තීරණාත්මක යුගයක් බවට පත්වීම සඳහා ආධාර විය. සිංහල සාහිත්‍යයේ විවිධ යුග හා සසඳන විට ප්‍රකාශන කර්මාන්තය සම්බන්ධයෙන් විශාල දියුණුවක් ද, විවිධත්වයක් ද, එකතුවීම් රැසක් ද ඇති කළ යුගයක් ලෙස කෝට්ටේ යුගය හැඳින්විය හැකිය.

කෝට්ටේ යුගය, ප්‍රකාශන කර්මාන්තය සම්බන්ධයෙන් ඉතා වැදගත් වන්නේ සාහිත්‍යකරණය පිළිබඳ අසහාය හැකියාවකින් යුක්ත වූ විද්වත් පරපුරක් මෙම යුග තුළ බිහි වී සිටීම යි. ඒ අතරින් වීදාගම හිමි සාහිත්‍යකරණයේ දී මෙන් ම දේශපාලන බලය සම්බන්ධයෙන් ද ඉහළ ස්ථානයක් හිමිකර ගෙන සිටියහ. උන්වහන්සේ VI වන පරාක්‍රමබාහු රජුට රාජ්‍යත්වය ලබා ගැනීම සඳහා මූලිකව ක්‍රියා කළ කෙනෙකි. රාජ්‍යත්වයට පත්වීමට පෙර සිට ම ශිල්ප ශාස්ත්‍ර ප්‍රගුණ කරවීම සම්බන්ධයෙන් ද රාජ්‍ය පාලන කටයුතු සම්බන්ධයෙන් ද සාහිත්‍යකරණය සම්බන්ධයෙන් ද අගතැන්පත් හිමිනමක් වූ උන්වහන්සේගේ දැනුම ද දේශපාලන බලය ද, මෙකල ග්‍රන්ථ ප්‍රකාශනය ඉහළ මට්ටමකට නැංවීම සඳහා ආධාරයක් වූ බව හඳුනාගත හැකිය. එමෙන්ම මෙම අවධියේ දී ග්‍රන්ථකරණයෙහි යෙදුණු තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, වෑත්තෑවේ හිමි වැනි හිමිවරුන්ගේ විශාරත්වය ද ප්‍රසිද්ධිය ද මෙකල විශාල සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීමට ප්‍රධාන හේතුවක් වී ඇති බව පෙනී යයි.

කෝට්ටේ යුගයේ දී ප්‍රකාශන කර්මාන්තයේ වැදගත්ම ස්ථානය හිමිකරගනු ලැබුවේ සන්දේශ කාව්‍යයයි. කෝට්ටේ යුගයේ දී එය දියුණුවට පත් වූ අතර විවිධ නිර්මාණවලින් යුතු විචිත්‍ර සාහිත්‍යයක් බිහි වීම සඳහා හේතු විය. පරෙවි, කෝකිල, ගිරා, හංස, සැළලිහිණි යන සන්දේශ කෘති මෙම යුගයේ දී බිහි විය. ඉහත සන්දේශ කාව්‍යයන් අතුරින් පරවි සන්දේශය සහ සැළලිහිණි සන්දේශය රචනා කරන ලද්දේ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසිනි. හංස සන්දේශය වීදාගම මෛත්‍රී හිමියන් විසින් ද කෝකිල සන්දේශය දෙවිනුවර තිලක පිරිවෙන් හිමියන් විසින් ද රචනා කරන ලද අතර ගිරා සන්දේශ කතුවරයා අඥාතය. එකකට එකක් පරයා යන ආකාරයේ කාව්‍ය ලක්ෂණ ද නිර්මාණ ද ඇතුළත් කර මෙම කෘති විද්වතුන් අතර මෙන්ම පොදු ජනයා අතර ප්‍රචලිත වේ. විසිතුරු වර්ණනාවන් මෙන්ම සිත් ඇදගන්නාසුලු විරිත්වලින් ද යුතු කාව්‍ය රචනා ජනප්‍රිය විශේෂාංගයක් බවට පරිවර්තනය වී තිබීම නිසා ඒ පිළිබඳ උනන්දුව වැඩි වී ගියේය. පසුකාලීනව ද සන්දේශ කාව්‍ය රචනා වුව ද කෝට්ටේ යුගයේ බිහි වූ සන්දේශ කාව්‍යවලට සමාන වන ආකාරයේ සන්දේශ කාව්‍ය කිසිවක් බිහිව ඇති බවක් හඳුනාගත නොහැක.

තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ අද්විතීය කවීත්වය කෝට්ටේ යුගයේ ප්‍රකාශන කර්මාන්තය කෙරෙහි දැඩිව බලපෑ බව ප්‍රකාශ කළ හැකිය. උන්වහන්සේ විසින් රචිත කාව්‍යශේඛරය මහා කාව්‍යයක් වූ අතර මෙකල ප්‍රකාශන කර්මාන්තය සියලු අංශවලින් පරිපූර්ණ එකක් බවට පත් කිරීම සඳහා එය ආධාර විය. සත්තුභක්තක ජාතකය මුල් කරගෙන සර්ග 15 කින් හා කවි 887 කින් යුක්තව මහා කාව්‍යයක් ලෙස එය රචනා කරන ලදී (සන්නස්ගල, 1961, පි. 306).

කෝට්ටේ යුගයේ දී ශ්‍රී ලංකාවේ ප්‍රකාශන කර්මාන්තයට එකතු වූ තවත් වැදගත් අංශයක් වන්නේ ප්‍රශස්ති කාව්‍ය රචනා ප්‍රකාශයට පත් වීමයි. ජීවමාන රජකු සම්බන්ධයෙන් රචනා කරන ප්‍රශස්ති හෝ විරුද කාව්‍යයන් ශ්‍රී ලංකාවට ආගන්තුක අංගයක්ව පැවැතුනි. එසේ වුව ද 10 වන සියවසේ සිට ඉන්දියාවේ ප්‍රශස්ති කාව්‍ය ජනප්‍රිය කාව්‍ය අංගයක් බවට පත්ව තිබුණි. පැරකුම්බා රජු වර්ණනා කිරීම අරමුණු කරගෙන රචනා කරන ලද පැරකුම්බා සිරිත ශ්‍රී ලංකාවේ ප්‍රථම ප්‍රශස්ති කාව්‍ය වූ අතර එය ඉතා උසස් ගණයේ කාව්‍ය රචනාවක් ලෙස ද සැලකේ.

කෝට්ටේ යුගයේ ප්‍රකාශන කර්මාන්යේ විශේෂ ලක්ෂණයක් වන්නේ ප්‍රශස්ති සඳහා විවිධ ආකාරයේ විරිත් උපයෝගී කරගෙන තිබීම යි. එක් එක් ආකාරයේ විරිත් උපයෝගී කරගෙන තිබීම නිසා ඒවා ප්‍රශස්ති වශයෙන් ගායනා කිරීමේ දී කන්කලු බව බව ඇති කිරීම සඳහා ආධාර වී තිබේ. ප්‍රශස්ති කාව්‍ය සඳහා රජුගේ අනුග්‍රහය ලැබීම නිසා එය ප්‍රචලිත වීම සඳහා ද අවස්ථාව සැලසුණි.

සිංහල සාහිත්‍යයේ විකාශය පිළිබඳ කරුණු නිරීක්ෂණය කිරීමේ දී පැහැදිලි වන කරුණක් වන්නේ සාහිත්‍යකරණය බොහෝදුරට සම්ප්‍රදායානුකූල මට්ටමකින් පවත්වාගෙන යාමයි. පාලි සහ සංස්කෘත භාෂාවෙන් ලද ආභාසය මේ සඳහා ආධාර විය. සිංහල සාහිත්‍යයේ දී බොහෝ දුරට සංස්කෘත සාහිත්‍යයේ එන ඡන්දෝලංකාර සහ රීති ආදිය ගුරු කොට ගන්නා ලද බව පෙනේ. ඒ නිසාම කෝට්ටේ යුගය දක්වාම ශ්‍රී ලංකාවේ ප්‍රකාශන කර්මාන්තය බොහෝ සම්ප්‍රදාය විසින් තීරණය කරන ලද්දක් යැයි ප්‍රකාශ කිරීම නිවැරදියි. එසේ වුව ද කෝට්ටේ යුගයේ දී පැරණි සම්ප්‍රදාය ඉක්මවා යමින් ප්‍රකාශන ඉදිරිපත් කිරීමට සමහර රචකයෝ ඉදිරිපත් වූහ. මේ අතර කැපී පෙනෙක කතුවරයෙකු වශයෙන් වෑත්තෑවේ හිමියන් හැඳින්විය හැකිය. සම්ප්‍රදාය අනුව මූසිල වැරදිකරුවා වන අතර එතෙක් සාහිත්‍ය තුළ ගුත්තිල කතාවස්තුව ගොඩනගා තිබුණේ මූසිල වැරදිකරු වන සහ ඔහු පිළිබඳ පාඨකයා තුළ ද්වේශයක් ඇති වන ආකාරයෙනි. වෑත්තෑවේ හිමි ඊට වඩා වෙනස් ලෙසකින් මූසිල පිළිබඳ අනුකම්පාවක් ඇති වන ආකාරයට ගුත්තිල කාව්‍ය රචනා කර ඇත. මේ ආකාරයේ ම වෙනසක් බුදුගුණ අලංකාරයේ දක්නට ලැබේ. වීදාගම හිමි මෙම කාව්‍ය උපයෝගි කරගෙන ඇත්තේ සාම්ප්‍රදායික දේව වන්දනාව දැඩි ලෙස විවේචනය කිරීම අරමුණු කරගෙන ය. දෙවියන් ආශ්‍රිත ව ඒ දක්වා රචනා කරන ලද සාහිත්‍ය කෘතීන්හි එන කතා වස්තු දැඩි ලෙස විවේචනය කරමින් හාස්‍යය සහ උපහාසය මුසු කරමින් දේව වන්දනා ප්‍රතික්ෂේප කර ඇත. මේ ආකාරයට කෝට්ටේ යුගයේදී දක්නට ලැබෙන කරුණක් වන්නේ ප්‍රකාශන කර්මාන්තය සම්ප්‍රදායෙන් බැහැර වන ආකාරයේ ස්වරූපයකට සමහර අවස්ථාවල දී පත්වීමයි.

කෝට්ටේ යුගයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රකාශන කර්මාන්තය විවිධත්වයට බඳුන් වී දියුණුවට පත් වූයේයැයි සැලකිය හැකි සාධක දැන් දැක ගැනීමට ලැබේ. අධ්‍යයනයට ප්‍රස්තුත යුගයේ දී ශ්‍රී ලංකාවේ ප්‍රකාශන කර්මාන්තය ඊට පෙර යුගවල තිබූ තත්ත්වයට වඩා විශාල පරිවර්තනයකට බඳුන් වූ බව හඳුනාගත හැකිය.

මෙම යුගයේ ග්‍රන්ථකරණයේ යෙදුණු භික්ෂූන් වහන්සේලා දේශපාලන වශයෙන් ප්‍රබල තත්ත්වයක සිටියහ. " VI වෙනි පරාක්‍රමබාහු රජු රජ පදවියට ගෙන ඒම සඳහා වීදාගම තෙරුන් වහන්සේ විශාල මෙහෙයක් ඉටු කළහ" (වාචිස්සර හිමි, 2003, පි. 30; රාජාවලිය, 1976. පි. 6). VI වන පරාක්‍රමබාහු රජුගෙන් පසු රජ වූ ජයබාහු රජු රජ පදවියට පත් කිරීමට මූලිකව ම කටයුතු කළේ ශ්‍රී රාහුල හිමියන්ය. ජයබාහු කුමරු ඝාතනය කර සපුමල් කුමරු, VI වන බුවනෙකබාහු (ක්‍රි. ව. 1469-1476) නමින් රජ වූ අතර ඒ සඳහා ආධාර වූයේ වීදාගම හිමියන්ගේ පාර්ශවය යි. මේ ආකාරයට රජවරු සහ ඔවුන් අතර පැවති සම්බන්ධතාවය කෝට්ටේ යුගයේ ප්‍රකාශන කර්මාන්තයේ ප්‍රබෝධය සඳහා ඉවහල් වූයේ යැයි ප්‍රකාශ කළ හැකිය.

කෝට්ටේ යුගයේ දී උතුරු මුල සහ මහනෙත් පාමුළ වශයෙන් පැවැති මහාවිහාර දෙක දේශපාලන ක්ෂේත්‍රයේ මෙන් ම ආගමික ක්ෂේත්‍රයේ ද බලවත් ස්ථානයක පැවතුනි. ඒ මත දේශපාලන සම්බන්ධතා ද ගොඩනැගී තිබුණි. උතුරුමුල ග්‍රාම වාසයට මහනෙත් පාමුළ ආරණ්‍ය වාසයට අයත් ව පැවති අතර උතුරු මුල සඟ පරපුර අතර රාහුල හිමියන් ද මහනෙත් පාමුළ සඟ පරපුර අතර වීදාගම හිමියන් ද මෙම යුගයේ දී කැපී පෙනුණි. උන් වහන්සේලා දෙදෙනා ශාසනික වශයෙන් ප්‍රමුඛතාවක් හිමි කරගෙන සිටි අතර දේශපාලන වශයෙන් ද රජු සමඟ ඉතා සමීප සම්බන්ධතාවක් පවත්වාගෙන ගියහ. මෙම සම්බන්ධතාව කෝට්ටේ යුගයේ දී රජු සහ ප්‍රකාශන කර්මාන්තය අතර සමීප බවක් ඇති කිරීම සඳහා ඉවහල් විය.

කෝට්ටේ යුගයේ ප්‍රකාශන කර්මාන්තය දියුණු කිරීම කෙරෙහි රජුගේ අනුග්‍රහය ඉතා වැදගත් වූ බව පෙනේ. VI වන පරාක්‍රමබාහු රජු ((ක්‍රි. ව. 1412-1467) ) සාහිත්‍යධරයකු මෙන් ම ගත් කතුවරු ද විය. (සන්නස්ගල, 1961, පි. 285) රජුගේ ග්‍රන්ථකරණය පිළිබඳ ව මහාවංසයේ මෙසේ සඳහන් වේ.

"අටුවා හා ටීකා සහිත වූ උතුම් ත්‍රිපිටකය පාලිය ද ලියවා සර්වඥයන් වහන්සේගේ ශාසනය සංග්‍රහ කළේය. ඒ නරේන්ද්‍ර තෙම එ කල්හි සද්ධර්ම පුස්තකයක් ම දවසක් දවසක් පාසා ලියනු පිණිස ලිපිකරුවන්ට ග්‍රාම ආදිය ද දිය දුන්නේය" (මහාවංසය, පරි. 91, පෙළ 27-29). මෙයින් පැහැදිලි වන කරුණක් වන්නේ පරාක්‍රමබාහු රජු විසින් ප්‍රකාශන කර්මාන්තය ඉතා ප්‍රබල තත්ත්වයකට ගෙන ඒමට කටයුතු කර ඇති බවයි. දවසක්, දවසක් පාසා ලියන පිණිස ලිපිකරුවන්ට ගම්බිම් ලබාදුන් බව සඳහන්

වීම තුළ කරුණු කිහිපයක් පැහැදිලි වේ. ඉන් පළමුවැන්න වන්නේ දවසක් පාසා ලිවීමට පිරිසක් සිටි බව යි. දෙවැනි කරුණ වන්නේ ඔවුන් ලිපිකරුවන් මිස ලේඛකයන් නොවන බවයි. මෙම කරුණු දෙකින් ම පැහැදිලි වන මූලික කරුණ වන්නේ VI වන පරාක්‍රමබාහු රජ විසින් මේ අවදියේදී ප්‍රකාශන කර්මාන්තය ඉතා විධිමත් ආකාරයකින් පවත්වාගෙන යෑමට කටයුතු කර ඇති බව යි. එමෙන්ම මේ තුළින් පැහැදිලි වන්නේ පොත් පිටපත් කිරීමේ කටයුතු පවත්වාගෙන ගිය ආකාරය ලිපිකරුවන් වශයෙන් හඳුන්වන පිරිස දිනපතා ග්‍රන්ථ පිටපත් කිරීමේ කාර්යයේ යෙදී සිටි බව යි. ඔවුන්ගේ එකම කාර්යය වුයේ ග්‍රන්ථ පිටපත් කිරීම යි. ඒ අනුව මීට පෙර යුගලට වඩා කෝට්ටේ යුගයේ දී ප්‍රකාශයට පත් වූ ග්‍රන්ථවල පිටපත් ප්‍රමාණය ඉහළ මට්ටමක පැවැති යැයි සිතිය හැකිය.

කෝට්ටේ යුගය තුළ ප්‍රකාශන කර්මාන්තය කොතරම් දුරට විද්වතුන් අතර මෙන් ම පොදු ජනතාව අතර ද ප්‍රචලිත ව පැවතියේ ද යන්න එම කර්මාන්තයේ විවිධ ශාස්ත්‍රීය සාකච්ඡා සඳහා මෙන් ම පොදු ජන විඥානය පුළුල් කිරීම සඳහා ද යොදා ගැනීම තුළින් පැහැදිලි වේ. ප්‍රකාශන කර්මාන්තයේ දියුණුවට පත්වී ප්‍රකාශට පත් වූ විවිධ කෘති නිරන්තරයෙන්ම එකල විසූ විද්වතුන් විසින් භාවිත කරන තත්ත්වයක් පැවති බව පැහැදිලි වේ. මීට හොඳම උදාහරණ ලෙස දැක්විය හැක්කේ හින්දු ද්‍රවිඩ බලපෑම පිළිබඳව මෙකල භික්ෂූන් අතර එක්තරා නිහඬ ස්වරූපයක් ගෙනගිය සාස්ත්‍රීය විවාදය යි.

රාහුල හිමි ප්‍රමුඛ භික්ෂුන් වහන්සේලා පිරිසක් සංස්කෘත ආරට ග්‍රන්ථකරණයේ යෙදෙන අතරම, ආගමික කටයුතුවල දී ද හින්දු ආභාසයට අනුව යමින් කටයුතු කරනු ලැබීය. එහෙත් වීදාගම සහ වැත්තාවේ වැනි හිමිවරුන් සංස්කෘත ආභාසයෙන් මිදුණු බස් වහරක් අනුගමනය කරන අතර හින්දු ආගමික මතවාදය සහ විශ්වාසයන්ට පහර දීමට ප්‍රකාශන කර්මාන්තය යොදා ගෙන තිබේ.

රහල් හිමි පරවි සංදේශය මගින් පරාක්‍රමබාහු රජුගේ වැඩිමහල් දියණිය වූ චන්ද්‍රවතී කුමරියට සුදුසු සැමියකුත් ඉන් අනතුරුව රජකම බාර දීමට සුදුසු පුතෙකුත් ලබාදීමට දෙවිනුවර උපුල්වන් දේවාලයට පරවියෙකු අත දේව ආයාචනයක් යවයි. සැළලිහිණි සංදේශය මගින් උලකුඩය කුමරියට පුතකු ලබා දෙන ලෙස කැලණියේ විභීෂණ දෙවියන්ට සැළලිහිණිය ලවා සංදේශයක් යවයි. එහෙත් ගිරා සංදේශයේ ගිරවා යවනුයේ දෙවියන් හමුවීමට නොවේ. තොටගමුවේ රාහුල හිමියන් හමුවීමට ය. උන්වහන්සේ ලවා නාථ දෙවියන්ට සංදේශය ඉදිරිපත් කිරීම අරමුණු කර ගෙනයි. හංස සංදේශයේ ග්‍රාහකයා කැරගල වනරතන හිමියන් ය. බුදුරජාණන් වහන්සේගේ රතන සූත්‍රය ලක්ෂවාරයක් කියවා පරාක්‍රමබාහු රජුට ආසිරි සලස්වන ලෙස වනරතන හිමියන්ගේ ඉල්ලීමට ය. එමෙන් ම උතුරු මුල තෙරුන් විසින් රචිත කුවේණි අස්න පැරකුම් රජුට සෙත් පැතීම සඳහා කරන ලද දේව යාදින්නක ස්වරූපයක් ගනියි. එක් පාර්ශ්වයක් දෙවියන්ට ආයාචනය කරන අතර තවත් පාර්ශ්වයක් ඊට ප්‍රතිවිරුද්ධ ලෙස භික්ෂූන් වහන්සේලාට ආයාචනය කරයි. ඒ අතර බුදුන් වහන්සේගේ ද ධර්මයේ පිහිට ද පතයි. හින්දු බලපෑම මත දෙවියන්ට ප්‍රමුඛත්වයක් ලැබෙන ආකාරයට එක්තරා පිරිසක් කටයුතු කරද්දී ඊට එරෙහිව ත්‍රිවිධරත්නයේ අගය පිළිබඳ තවත් පිරිසක් උනන්දුවක් දැක් වූ බව මෙකල ප්‍රකාශන කර්මාන්තයේ ප්‍රචලිත වීම සඳහා මේ ආකාරයේ ශාස්ත්‍රීය මතවාදවලින් ප්‍රබෝධයක් ලැබුණු බව සැලකිය හැකිය.

මෙම විවාදය පසු කාලයේ දී වඩාත් උණුසුම් ස්වරූපයක් ගත් බව පෙනේ. සන්දේශ කාව්‍ය හින්දු දෙවිවරුන්ගේ බලය අතිමහත් ලෙස වර්ණනා කර තිබිය දී වීදාගම හිමි එයින් ඇතිවන ආගමික බලපෑම් පිළිබඳ කම්පා වූ බව පෙනේ. ඒ නිසා එවැනි මතවාදවලට දැඩි ලෙස පහර දීමට ඉටා ගත් උන්වහන්සේ බුදුගුණාලංකාරය රචනා කළහ. සමහර සාහිත්‍ය කෘතිවල වර්ණනාවට පාත්‍ර ව සිටි දෙවිවරුන්ට නිර්දය ලෙස පහර දුන් උන්වහන්සේ යාග හෝම ශාන්තිකර්ම සහ දේව පූජාවන් නිරර්ථක කාර්යයක් ලෙස හඳුන්වා දෙනු ලැබීය. මෙම යුගය තුළ දී ප්‍රකාශන කර්මාන්තයේ වියතුන් අතර ශාස්ත්‍රීය සංවාද සඳහා අවස්ථා සලසා දී ඇති බව පෙනේ. එයින් ප්‍රකට වන අනිත් කරුණ වන්නේ ප්‍රකාශයට පත් වූ කෘති පහසුවෙන් පරිශීලනය කර ගැනීමට හැකි වන පරිදි ඒවා වියතුන් අතර ප්‍රචලිතව පැවති බවයි. මෙම විවාදය පොදු ජනතාව අතරට ගෙන යෑම සඳහා ද හින්දු ආභාසය ට එරෙහි වූ පිරිස් කටයුතු කළහ.

"වීදාගම හිමියෝ ගැමි බසින් බුදු ගුණ ගයමින් බලි පොත් ලියා එය සිය මෙහෙකරු නැකතියාට දුන්හ" (වාචිස්සර හිමි, 2003, පි. 32) ඒ ආකාර ලියන ලද කෘතියක් වන්නේ රත්නාලංකාරය යි. ඒ අතරම වීදාගම හිමි විසින් රචනා කරන ලද ලෝවැඩ සඟරාව පොදු ජනතාවට බුදුගුණ අවබෝධ කරදීම සඳහා පොදු ජන ව්‍යවහාරයෙන් රචිත කෘතියකි. මේ ආකාරයට පොදු ජනයාගේ භාවිතය සඳහා කෘති රචනා කිරීම තුළ පැහැදිලි වන තවත් කරුණක් වන්නේ ග්‍රන්ථ ප්‍රකාශන මේ යුගයේ දී බෙහෙවින් ම ව්‍යාප්ත වී පැවතුණ බවයි. අනෙක් අතට ශ්‍රවණ මාර්ගය භාවිත කිරීමට පොදු ජනතාවට අවස්ථාව සලසා තිබුණි.

කෝට්ටේ යුගයේ ප්‍රකාශන කර්මාන්තය පිළිබඳව විමර්ශනය කරන විට තවත් කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ වෙන කවර යුගයකට වත් නොතිබූ අයුරින් මෙම යුගයේ දී භික්ෂූන් වහන්සේලා

ධර්ම ශාස්ත්‍රීය ප්‍රබෝධය සඳහා කටයුතු කිරීමත් එය ප්‍රකාශන කර්මාන්තයේ ප්‍රගතිය සඳහා බෙහෙවින් ඉවහල් වීමත් ය. ඉහත සඳහන් කළ පරිදි උතුරු මුල සහ මහනෙත් පාමුල පාර දෙක අතර භික්ෂූන් වහන්සේලාගේ ප්‍රබලත්වය රජ තනතුරේ වෙනස්කම් සඳහා පවා ඉවහල් විය. ඒ ආකාරයටම මෙම යුගයේ දී උගත්කමින් ද සාහිත්‍ය දැනුමින් ද පර පරිපෝෂිත වූ භික්ෂූන් වහන්සේලා රැසක් වැඩ විසූහ. මෙකල විසූ උගත් භික්ෂූන් වහන්සේලා බොහෝ නමක් විසින් ග්‍රන්ථ රචනයේ යෙදුණ අතර ග්‍රන්ථ රචනය සඳහා ඉවහල 'වන ආකාරයේ ශිෂ්‍ය පරපුරක් ගොඩනැගීමට ද කටයුතු කළහ. ඉහතින් සඳහන් කළ වීදාගම හිමි, රාහුල හිමි සහ වැත්තෑවේ හිමි වැනි හිමිවරුන්ට අමතරව භික්ෂූන් වහන්සේලා විශාල පිරිසක් ග්‍රන්ථකරණයේ නියැලී සිටියහ. කැරගල වනරතන මාහිමි, උස්සාපිටිය මහා පියා පිරිවෙන් හිමි, ගලතුරුමුල මේධංකර හිමි, බුවනෙකබා හිමි, රම්මුංගොඩ දීපංකර හිමි හා නියදවනයේ වුස්සදේව සුමංගල හිමි මේ යුගයේ විසූ මහා පඬිවරුන් වේ (බස්නායක, 2002 පි. 311; සන්නස්ගල, 1961, පි. 333). මීට අමතරව සුනේත්‍රා මහා පිරිවෙන්පති මංගල හිමි දෙව්නුවර තිලක පිරිවෙන්පති හිමි, දම්මදින්න හිමි, ධර්මසේන හිමි වැනි හිමිවරුද ග්‍රන්ථකරණයේ යෙදුණාහ.

ඒ අතරම අප්‍රකට හෝ තම නම පැහැදිලි කිරීම උනන්දුවක් නොතිබූ හිමිවරුද පිරිසක් ද මෙකල සිටියහ ගිරා සංදේශ එවැනි ග්‍රන්ථයකි. ශ්‍රී ජයවර්ධනපුර, තමන් විසූ වෙහෙරින් ගිරවා නික්මවා ඇති බැවින් ගිරා සන්දේශය හිමිනමක විසින් ලියන්නට ඇතැයි සැලකිය හැකිය. හංස සන්දේශය ද කතුවරයා අප්‍රකට ව ඇති අතර එයද භික්ෂූන් වහන්සේ නමක විසින් රචිත යැයි අදහස් කෙරේ. සමහරු මෙම කෘතිය විදාගම හිමි විසින් රචනා කර ඇතැයි සලකන නමුදු සමහර විද්වත්තු ගත්කරු සැඟවී සිටින බව අදහස් කරති. (සන්නස්ගල, 1961, පි. 321) කයිනානිසංස ද කතුවරයා අප්‍රකට කෘතියකි. එය භික්ෂූන් වහන්සේ නමක විසින් රචනා කරන්නට ඇතැයි සැලකිය හැකිය. මේ ආකාරයට තම නමින් ප්‍රකටව සිටි භික්ෂූන් වහන්සේලා රැසක් ද අප්‍රකට භික්ෂූන් වහන්සේලා රැසක් ද ග්‍රන්ථකරණයේ යෙදී සිටියහ. කෝට්ටේ යුගයේ ග්‍රන්ථ කතුවරුන් අතර VI වන පරාක්‍රමබාහු රජු හැරුණු විට ගිහියන් දක්නට ලැබෙන්නේ ස්වල්පයකි.

මෙම යුගයේ ප්‍රකාශන කර්මාන්තය සඳහා බෙහෙවින් ආධාර වූ කරුණක් වන්නේ ඉතා විශිෂ්ට ලෙස දියුණු ට පත් පිරිවෙන් රැසක් මෙම අවධියේ දී රට පුරා ව්‍යාප්තව පැවතීමයි. තොටගමුවේ විජයබා පිරිවෙන, දෙවුන්දර නන්දන පිරිවෙන, වැලිගම අග්‍රබෝධි පිරිවෙන, කුරුණෑගල ශ්‍රී පරාක්‍රමබාහු පිරිවෙන, වීදාගම ශ්‍රී ඝනානන්ද පිරිවෙන, කැලණියේ ගතාරා පිරිවෙන, කැරගල පද්මාවතී පිරිවෙන, නියංගම්පායේ ජයමහලේ සිටු පිරිවෙන, ලංකාතිලකයේ ලංකා සෙනෙවිරත් පිරිවෙන, ගඩලාදෙණියේ සද්ධර්මතිලක පිරිවෙන ආදී පිරිවෙන් එම යුගයේදී ඉතා දියුණු තත්වයක පැවති අතර අති විශාල ශාස්ත්‍රීය සේවාවක නිරත විය (බස්නායක, 2002, පි. 312). කැරගල පිරිවෙන බොහෝ රටවල භික්ෂූන් වහන්සේලා අධ්‍යාපනය ලැබූ ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යාපන ආයතනයක ස්වරූපය ඉසිලීය. එහි භාෂා මාධ්‍යය වූයේ පාලි භාෂාව යි. (ඉලංගසිංහ, 2005, පි. 204) මෙකල තොට ගමුවේ විජයබාහු පිරිවෙන බ්‍රාහ්මණ ශිෂ්‍යයන් ද වේද වේදාංග පවා හැදෑරූ විද්‍යායතනයක් වශයෙන් පැවතුනි. මෙම පිරිවෙනෙහි භාෂා මාධ්‍ය සංස්කෘත විය (ඉලංගසිංහ, 2005, පි. 204).

කෝට්ටේ යුගයේ දී පිරිවෙන් විද්‍යාස්ථාන මේ ආකාරයට ඉතා දියුණු මට්ටමක පැවැතීම හේතුවෙන් එය ප්‍රකාශන කර්මාන්තය සඳහා කිහිප ආකාරයකින්ම ආධාර විය. පොත්පත් පරිහරණය අධ්‍යාපනය සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන බැවින් මෙම සෑම විද්‍යාස්ථානයකම භාවිතයට ගත හැකිය. පරිදි එකල ප්‍රකාශට පත් කරන ලද පොත්වලින් පිටපත් සැලකිය යුතු ප්‍රමාණයක් බිහි වන්නට ඇතැයි සිතිය හැක. එසේම භික්ෂූන් වහන්සේලා විශාල පිරිසක් මෙම පිරිවෙන්වල අධ්‍යාපන ලැබීමත් ඉගැන්වීමේ කටයුතුවල නියැලී සිටීම නිසා ග්‍රන්ථ රචනය සහ ප්‍රකාශනයට අවශ්‍ය විද්වත් පරපුරක් බිහි වී සිටියහ.

**නිගමනය**

කෝට්ටේ යුගය ශ්‍රී ලංකාවේ ප්‍රකාශන කර්මාන්තය ඉතා දීප්තිමත් අවස්ථාවක් වෙත ගෙන යාම සඳහා මඟ පෑදුවේය. බොහෝ කලකට පසු රට එක්සේසත් කළ VI වන පරාක්‍රමබාහු රජු ද ග්‍රන්ථ කතුවරයෙක් විය. මෙම යුගයේ මුල් පෙළේ ග්‍රන්ථ කතුවරුන්ට භික්ෂූන් වහන්සේලාට, රජවරුන් පත් කිරීම සහ පහ කිරීම සම්බන්ධයෙන් මූලිකව ක්‍රියා කිරීමට හැකි වන ආකාරයේ දේශපාලන බලයක් හිමිව තිබුණි. ඒ ආකාරයට ග්‍රන්ථ ප්‍රකාශනය රටේ දේශපාලන බලය සමඟ ඒකාබද්ධ වන ආකාරයේ ප්‍රබලතත්වයක් මෙම යුගයේ දී ඇතිවී තිබුණි. දිනපතා පොත් ලේඛනගත කිරීමේ නියැලී සිටි රජයේ වැටුප් ලබන පිරිසක් සිටි බවට තොරතුරු හෙළි විය. ඒ තුළින් පැහැදිලි වන්නේ නවීන ග්‍රන්ථ ප්‍රකාශන කර්මාන්තයේ මෙන් ම එම අවධියේ ද එම කර්මාන්තය ආශ්‍රිතව ශ්‍රම විභජනයක් පැවති බව යි. පිරිසක් ග්‍රන්ථ රචනා කළේය. තවත් පිරිසක් ඒවා පිටපත් කළේය. පුස්කොළ ආදිය සකස් කිරීමට වෙනම පිරිසක් සිටියේ යැයි නිශ්චය කළ හැකිය. අනෙක් අතට ප්‍රකාශනය සඳහා අනුග්‍රහය දැක්වූ එසේ නැත්නම් ප්‍රකාශනය භාර ගත් පිරිසක් ද සිටියහ. එම පිරිසට රජු, ඇමතිවරුන් සහ සිටුවරුන් ද අයත් වූහ.

මෙම යුගයේ දක්නට ලැබෙන තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ ආගමික මතිමතාන්තර පිළිබඳ ඉතා දියුණු ආකාරයේ සංවාද පවත්වාගෙන යෑම සඳහා ප්‍රකාශන කර්මාන්තය ඉවහල් වී තිබේය යන්නයි. එකල යතිවරුන් අතර පැවැති හින්දු බලපෑම සහ දේව වාදය පිළිබඳ මත වාද උද්දීපනය කිරීම සඳහා ග්‍රන්ථකරණය යොදා ගනු ලැබූ අතර ඒ තුළින් පොදු ජනතාවට දැනුම හා අවබෝධය ලබා දෙන එමෙන්ම බොහෝ දෙනෙකුට ග්‍රන්ථ පරිශීලනය සඳහා අවස්ථාව ලබාදෙන ප්‍රකාශන කර්මාන්තයත් බිහිවීම සඳහා ඉඩ සැලසුණි.

පළමුවරට ශ්‍රී ලංකාවට අත්විදීමට ඉඩ ලැබුණු යුරෝපීයයන්ගේ ආගමනය ද ප්‍රකාශන කර්මාන්තය කෙරෙහි බලපෑ ආකාරය කොට්ටේ යුගය තුළ දී දක්නට ලැබේ. මෙම යුගයේ ශ්‍රී ලංකාවට පැමිණි ලන්දේසීන් නිසා පසු කාලයේ දී ඔවුන්ගේ ක්‍රියාකාරකම් ආශ්‍රිතව ද ග්‍රන්ථ බිහිවන ආකාරයේ පසුබිමක් ඇති වූයේය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

ඉලංගසිංහ, එම්. (2003). *මහාවංසය සහ ශ්‍රී ලංකාවේ ඉතිහාස සම්ප්‍රදාය.* කර්තෘ.

ඉලංගසිංහ, එම්. (2005). *මධ්‍යකාලීන ලංකාවේ ආගම්.* ගොඩගේ.

ඉලංගසිංහ, එම්. (2006). *මහාවංසො.* ගොඩගේ.

පඤ්ඤාසේකර හිමි, කළුකොඳයාවේ. (1965). *සිංහල පුවත්පත් සඟරා ඉතිහාසය 1-9.* ගුණසේන.

පෙරේරා, ඩබ්. ඒ. (1961). *මුද්‍රණ ශිල්පයේ ඉතිහාසය.* සමන් මුද්‍රණාලය.

බස්නායක, එච්. ටී. (2002). *ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය 02.* බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බස්නායක, එච්. ටී. (2005). *ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය 03 (ඉංග්‍රීසි පාලන සමය).* ගොඩගේ.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. (2003) *සිංහල මහාවංශය.*

වාචීස්සර හිමි, කොටගම. (2003) *සරණංකර සංඝරාජ සමය.* විසිදුනු.

සන්නස්ගල, පී. (1961). *සිංහල සාහිත්‍ය වංශය.* ගොඩගේ.

සූරවීර, ඒ. වී. (1976). *රාජාවලිය.* ලේක්හවුස්.

හපුආරච්චි, ඒ. (2003). *මුද්‍රණ ශිල්පය : ප්‍රභවය හා පරිණාමය ශ්‍රී ලංකාවට විශේෂිතව.* කර්තෘ.

හේමපාල, එන්. (1987). *සිංහල මුද්‍රණය හා පුවත්පත් ඉතිහාසය.* ළමාපොත් මන්දිරය,.

Altbach, P.G. & Hoshino, E.S. (Eds.) (1995). *International Book Publishing: An Encyclopaedia.* Garland.

Briggs, A. (Ed.) (1974). *Essays in the history of publishing.* Longman.

Hallewell, L. (1982). *Books in Brazil : A history of publishing trade*. N.J. Scarecrow.

Tebbel, J. (1972). *A history of book publishing in the United States.* R.R. Bowker.